# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2149/29 - 2019 නොවැම්බර් මස 15 වැනි සිකුරාදා - 2019.11.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත**

57 වන වගන්තිය යටතේ නියෝගය

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 57 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍ය රවී කරුණානායක වන මම, ලංකා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇති මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම අත්පත් කර ගැනීමේ යෝජනාව, මෙම නියෝගය මගින් අනුමත කරමි.

රවී කරුණානායක,
විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍ය.

2019 නොවැම්බර් මස 14 වැනි දින,

**උපලේඛනය**

ශ්‍රී ලංකාද්වීපයේ බස්නාහිර පළාතේ, කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ, පස්දුන් කෝරළයේ, පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 836L දරන කොස්ගුලන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පැලෑද ග්‍රාමයේ පිහිටි ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද අනුරේඛන අංක Ka/PLN/17/761, 2018.03.06 දිනැති සැලැස්මෙහි C වශයෙන් දැක්වෙන පහත සඳහන් පරිදි මායිම් සහිත ප්‍රමාණය පර්චස් 1.91ක් පමණ වූ මුළු ඉඩමෙහි මායිම් පහත දැක්වෙන පරිදි වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර්ගය, ලංකා විදුලිබල මණ්ඩලය, |
| *නැගෙනහිරට* | : | කේ. තිලකරත්නට අයත් ඉඩම, |
| *දකුණට* | : | මාකෙලිය දොල රක්ෂිතය, |
| *බටහිරට* | : | මාකෙලිය දොල රක්ෂිතය. |
| ඉඩමේ ප්‍රමාණය | : | පර්චස් 1.91. |
| හිමිකම් කියනඅය | : | නොදනී |

11 - 1545

1A - G 31463 — 27 (2019/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*